# හොළොම්බුව “ස්ත්‍රීපුර” රජමහා විහාරය

ඩී. බී. ඇල්කඩුව (ලේක්හවුස් කර්තෘ මණ්ඩලය)
ඡායාරූප :- සමන් කුමාර ඇල්කඩුව



ගල්ලෙන් ආරුක්කුවක් තුළ පිහිටි විහාරස්ථානය

කොළඹ – මහනුවර මාර්ගයේ නෙළුන්දෙණිය හන්දියෙන් හැරී ගලපිට මඩ මාර්ගයේ ගොස් “තුංතොට” හන්දිය පසුකර ගියවිට “හෙළොම්බුව“ ඉපැරැණි ගම්මානය සහ “හොළොම්බුව ස්ත්‍රීපුර රජමහා විහාරය හමුවේ. හෙළොම්බුව යන නම ලැබී ඇති ආකාරය පිළිබඳ ජනප්‍රවාද දෙකක් ඇත. දැදිගම ආසන්න මෙම ගමෙහි පැරැණි දේවාලයක් තිබූ බවත්,

“සලඹක්” අහසින් පැමිණ නා ගසකවැදී නැවතුණ හෙයින් “හොළොම්බුව“ වූ බවත්, කියැවේ. එහි ඇති දේවාලයේ ඉතා විශාල “සලඹවල්” රැසක් ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

“ජලය” හෙවත් “අඹ” සෙලවෙන ස්ථානය යන ඉතා ආකර්ශණීය අඩි 60 පමණ උස සොභාවික ගලෙන් සෑදුණ ආරුක්කුවක් යටින් හොළොම්බුව ස්ත්‍රීපුර රජමහා විහාරයට පිවිසිය යුතුය.




පැරණි වැසිකිලි ගලක්

එහි ඇති ගල්ලෙන් විහාරය තුළ 18 රියන් සැතපෙන පිළිමයක් හා තවත් පිළිම රැසක් ඇත. සුවිශාල ගල්ලෙනක් වන මෙම විහාරගෙය දකුණු පසින් අඩි 150 ක් පමණ දුරට විහිදී යයි. මෙම ගල්ලෙන් කෙළවර දෙකට බෙදී එක කොටසක් පොළොව යටට යන පඩිපෙලක් මඟින් උමං මාර්ගයකට පිවිසේ.

මේ උමං මාර්ගය මඟින් මීට සැතපුම් පහකට (5) පමණ දුර පිහිටි “යඨහලෙන” විහාරය දක්වාද, අනෙක් මාර්ගය “ගුරුගොඩ” ඔයේ “තෙලිඇල්ල” නම් ස්ථානය දක්වාද යා හැකිව තිබූ බව කියැවේ. කාලයාගේ ඇවෑමෙන් මෙම උමං මාර්ග ඇහිරී ගොස් ඇත.

ගල්ලෙන් අනෙක් පස අඩි 100 ක් පමණ වූ විශ්කම්භයෙන් යුත් අඩි 6 ක් පමණ ගැඹුර ඇති සොභාවික දිය පොකුණකි. ඉතා පිරිසිදු නිල්වන් දියෙන් පිරී ඇති මෙහි ජලය කිසිදිනක අඩු නොවන බවත් මීට සැතපුමක් පමණ පහළින් පිහිටි “කොටවෙහෙර” “(සූතිඝර)” අසල “නයි පහණ” නම් කුඹුරු යාය සී සානවිට මෙම දිය පොකුණේ ජලය බොරවන බවත් ජනප්‍රවාදයේ කියැවේ.

වළගම්බා රජු සිය අන්තඃපුර බිසෝවරු පන්සියයක් මෙහි රඳවා සිටි බවත් ඔවුන්ට දිය බීමට හා නෑමට මෙම පොකුණ උපයෝගී කරගත් බවත් පැවසෙන අතර, “යඨහලෙන” වන්දනා කිරීමට හා “හෙලිඇල්ල” දිය කෙළිය සඳහා යාමට මෙහි ඇති උමං මාර්ග දෙක උපයෝගී කරගත් බවත් ඇතැමෙක් පවසති.



දුණු කැකුණු සෙල්ලිපිය

මේ අතර “ස්ත්‍රීපුර” රජමහා විහාරය “ගජබා” රජ සමයට සම්බන්ධවන පුවතක්ද අසන්නට ලැබේ. මෙම ප්‍රදේශයේ විසූ “යක්ෂ ගෝත්‍රික” ස්ත්‍රීන් 500 ක් මෙම ගල්ලෙනෙහි සිරකර ගජබා රජු විසින් මරා දැමුණු බවත්, ඉන්පසු “අර්යයන්” යක්ෂභයින් මිදුණු බවත්, කුරුණෑගල විස්තරය නම් ග්‍රන්ථයෙහි සඳහන් වෙයි. ප්‍රදේශයේ පිහිටීම හා ආශ්‍රිත තොරතුරු සලකා බලන විට මෙම පුවත සත්‍යවීමට බොහෝ දුරට ඉඩ ඇත. මෙම විහාරස්ථානයට යාබද “ලූණුකැකුරුගල” නම් වූ ගල්තලාවේ බ්‍රාහ්මී අක්ෂර වලින් ලියැවුණු සෙල්ලිපියකි. මෙය තවමත් නිසි ගවේශණයට ලක්ව නැති බවත් විද්වතුන්ගේ අවධානයට ලක්විය යුතු බවත් පෙනේ.

පසුකාලීනව මෙම ප්‍රදේශයේ “පෘතුගීසි” බලකොටුවක් හා ලන්දේසි බලකොටුවක් පැවැති බවටද සාක්ෂි ඇත. එකල විහාරස්ථානයට ලැබුණු වී. ඕ. සී (සෘ.ණී.බ්) ලකුණ ඇති “නැව්පහන” නම් වූ විශාල කෞතුක වටිනාකමක් ඇති තඹ පහණක් මෙහි තිබී ඇත. 1989 දි නිධන් හොරු මෙහි චෛත්‍ය බිඳ දමා මෙහි තිබූ “පහනද” රැගෙන ගොස් ඇත.

මෙම විහාරස්ථානයෙහි ඉපැරැණි බෝධියක් ද ඇති අතර එය මුලුමනින්ම ගලක් මත පිහිටා තිබීම විශේෂත්වයකි.

දැනට “රම්බඩිගල මේධානන්ද හිමියන් විහාරාධිපතීත්වය දරන අතර, කුඹුක් කොටුවේ සීලවංශ හිමියන් භාරකාරත්වය උසුලති. 1986 දී ආරම්භ කරන ලදුව අදටද පවත්වාගෙන යන “හොළොම්බුව ශ්‍රී නන්දසාර දහම් පාසල” ප්‍රදේශයේ දරු දැරියන් 150 කට පමණ දහම් දැනුම ලබාදීම අගය කළ යුතු සේවාවකි. ලංකාවේ ඇති සුවිශේෂී (ඇතැම් විට ලංකාවේ ඇති දිගම උමං මාර්ගය ඇති) ලෙන් විහාරයක් වන මෙම ස්ථානය නැරඹීමට විශාල වශයෙන් ජනයා ඇදී එති. මෙම ස්ත්‍රීපුර විහාරස්ථානය සංරක්ෂණය කර ඉදිරි පරපුරට දැකබලා ගැනීමට සැලැස්වීම අපසතුයතුකමකි.